**පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන සහ**
**වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්,**
**කර්මාන්ත හා ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය**

# බස්නාහිර පළාත

## පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත)

# ඇබෑර්තු

### 01. ප්‍රධාන ඉංජිනේරු - තනතුරු 01

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් B.Sc. ඉංජිනේරු විද්‍යාව (සිවිල්) උපාධියක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පිළිගත් වෙනත් ඕනෑම ආයතනයක ආයතනික සාමාජිකත්වය (සිවිල් ඉංජිනේරු විද්‍යාව) සහ වරලත් ඉංජිනේරුවරයකු ලෙස ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) ලියාපදිංචි වී තිබීම<br>සමග<br>සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක, **"කළමනාකරණ මට්ටමේ"** අවම වශයෙන් වසර 13 ක පළපුරුද්ද. |
| **වයස් සීමාව** | : | අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. |
| **ස්ථිර පදිංචිය** | : | ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය. බස්නාහිර පළාත තුළ අවුරුදු 03 ක ස්ථිර පදිංචිකරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ. |
| **මාසික කොන්ත්‍රාත් දීමනාව (අවම)** | : | රු. 105,399.00 + රු. 17,800.00 (ජීවන අංක දීමනාව) |

### 02. කළමනාකරණ සහකාර (තාක්ෂණ නොවන) - තනතුරු 11

| | | |
|---|---|---|
| **සුදුසුකම්** | : | (අ) පහත විෂයන් ඇතුළුව විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස. (සා/පෙ) විභාගය විෂයන් හයකින් (06) සමත් වී තිබීම.<br>i. සිංහල / දෙමළ<br>ii. ගණිතය<br>සහ<br>(ආ) අ.පො.ස. (උ/පෙ) විභාගය විෂයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.<br>සහ<br>(ඇ) අ.පො.ස. (සා/පෙ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. |
| **වයස් සීමාව** | : | අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| **ස්ථිර පදිංචිය** | : | ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු අතර, අවුරුදු 3 ක කාලයක් සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය. |
| **මාසික කොන්ත්‍රාත් දීමනාව (අවම)** | : | රු. 40,403.00 + රු. 17,800.00 (ජීවන අංක දීමනාව) |

**වෙනත්**

**සියලුම අයදුම්කරුවන්,**

i. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ii. විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

| | | |
|---|---|---|
| **මාසික කොන්ත්‍රාත් දීමනාව** | : | අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද මත තීරණය කරනු ලැබේ. |
| **රැකියා කොන්දේසි** | : | පත්වීම වසරක කොන්ත්‍රාත් පදනමක් මත සිදු කෙරේ. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන නිලධාරීන්ට, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ (බස්නාහිර පළාත) කිසිදු ස්ථිර පත්වීමක් සඳහා හිමිකම් කිව නොහැක. |
| **වෙනත් ප්‍රතිලාභ** | : | සේවක අර්ථසාධක අරමුදල සඳහා අධිකාරිය මගින් 12% ක් බැර කරනු ලබන අතර, සේවකයා විසින් 8% ක් බැර කළ යුතුය. සේවක භාරකාර අරමුදල සඳහා අධිකාරිය විසින් 3% ක දායකත්වයක් ලබා දෙන අතර, රජයේ අනුමත වෙනත් දීමනා ගෙවනු ලැබේ. |

අධ්‍යාපනික සුදුසුකම්, වැඩ පළපුරුද්ද, වෙනත් අදාළ තොරතුරු සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) සම්බන්ධතා තොරතුරු සමග සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් (CV) 2025.12.12 දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම් කරනු ලබන තනතුර කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**සභාපති,**
**පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප.),**
**අංක 59, ශාන්ත සෙබස්තියන් කන්ද, කොළඹ 12.**
**දුරකථන : 0112321996, 0715101501, 0714526202**